**ශීර්ෂය 150- ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2016 වර්ෂය**

---

ශීර්ෂය 150 - ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 09 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත.එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 442.77 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 405.76 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 37.01 ක් හෙවත් සියයට 8.36 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 214.67 | 213.50 | 1.17 | 0.54 |
| මූලධන | 228.10 | 192.26 | 35.84 | 15.71 |
| **එකතුව** | **442.77** | **405.76** | **37.01** | **8.36** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය විසින් 2016 වර්ෂය සඳහා එක් ආදායම් සංකේතයක් සඳහා රු.මිලියන 26.14 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 32.27 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 123.45ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.21 | 26.14 | 32.27 | 6.13 | 23.45 |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 15001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 3.50 | 3.48 | 2.00 | 2.19 | 12.00 | 8.50 |

**2.4 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0437/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 13.30 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 6000/0000/00/0018/0086/000 දරන තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.23 ක් විය.

## 2.6 විගණන නිරීක්ෂණය

----------------------

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (ආ) හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ඇ) නිවාඩු පිළිබඳ ලේඛනය | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ඈ) වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

### 3.2 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03 ක ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදනයම හා තවත් වැය විෂයයන් 04 ක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 68 සිට සියයට 90 අතර ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන්ට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 66 මාරුකිරීම්වලට අමතරව පරිපූරක ඇස්තමේන්තු මඟින් අතිරේක ප්‍රතිපාදන වැය විෂයයන් 10 කට ලබාගෙන තිබුණි. ඉන් එක් වැය විෂයයකට වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන නොතිබූ අතර පරිපූරක ඇස්තමේන්තු මඟින්ම පමණක් රු.මිලියන 70 ක් ලබාගෙන තිබුණි. තවත් වැය විෂයයන් 09 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 9200 දක්වා ප්‍රමාණයක් පරිපූරක ඇස්තමේන්තුවලින් ප්‍රතිපාදන ලෙස ලබාගෙන තිබුණි.

(ඇ) විදේශ ගමන් වියදම් වැය විෂය යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියනයක් වූ අතර මීට අමතරව පරිපූරක ඇස්තමේන්තු 02 ක් මඟින් රු. මිලියන 1.66 ක් හා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීම් මඟින් අවස්ථා දෙකකදී රු. මිලියන 0.9 ක් ලබාගෙන තිබුණි. ඒ අනුව මෙම වැය විෂයයේ මුල් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 256 ක් එනම් රුපියල් මිලියන 2.56 ක් අතිරේක ප්‍රතිපාදන ලෙස ලබාගෙන තිබුණි.

(ඈ) වැය විෂයයන් 20 කට අදාලව ලබා දී තිබූ රු.58,050,000 ක ප්‍රතිපාදන වර්ෂය අවසන් වීමට පෙර අවසන්වීම නිසා එම වැය විෂයයන්ට අදාල රු.15,870,589 ක වැය වෙනත් වැය විෂයයන් 13 ක් යටතේ වැය කර පසුව ගිණුම්ගත කිරීමේදී සිදුවී ඇති වියදම් වර්ගීකරණ දෝෂ නිවැරදි කිරීම් ලෙස දක්වමින්, ජර්නල් සටහන් මගින් අදාල වැය විෂයයන්ට හර කර තිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 7/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව 2016 වාර්ෂික ඇස්තමේන්තුවල ඉන්ධන සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් හා ප්‍රවාහනය සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් අනිවාර්යයෙන් ඉතිරි කළ යුතු වුවත් එම වැය විෂයයන් දෙක සඳහා අනිවාර්ය ඉතිරිකිරීම් සිදු කර නොතිබුණි.

**3.3 ආදායම් ගිණුම්**

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් අංක 20.03.02.21 දරන ආදායම් සංකේතය සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2016 වර්ෂය සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම් රැස් කිරීම අතර වෙනස වූ රු.6,129,859 සඳහා බලපෑ හේතු ලෙස "නැව්තෙල් වෙළඳාම සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව 2016 ජුලි 21 දින සිට බලාත්මක වන පරිදි ඇමරිකන් ඩොලර් 100 සිට 1,000 දක්වා සංශෝධනය වීම" ලෙස ආදායම් ගිණුමේ අංක 18 යටතේ වාර්තා කර තිබුණි. එහෙත් එම හේතුව මගින් ආදායමේ ඉහළ යෑමට වන බලපෑම රු.785,691 ක් වුවද සංශෝධිත ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම් රැස් කිරීම අතර වෙනස රු. 6,129,859 ක් විය. ඉන් රු.4,340,000 ක මුදලක් සඳහා හේතු වූයේ 2016 වර්ෂයේ ලංකා ඛනිජතෙල් නිතිගත සංස්ථාව, මැලේසියානු සමාගමක් හා එක්ව ශ්‍රී ලංකා රජය සමග ලිහිසි තෙල් ආනයනය සම්බන්ධයෙන් නව ගිවිසුමට එළඹීමට ප්‍රමාද වීම නිසා එම කාළපරිච්ඡේදය වෙනුවෙන් හිඟ බලපත්‍ර ගාස්තු එකවර ලැබීම බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 15001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු 91,478 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ සඳහා වර්ෂ 3 සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත් ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, 2016 සමාලෝචිත වර්ෂය

වෙනුවෙන් ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය නමින් පිළියෙල කර ඇති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හතරට අදාලව පමණක් පිළියෙල කර තිබුණි.

**3.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

---

අමාත්‍යාංශය විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණ ද 2016 වර්ෂයේ දී සිදු කරන ලද රු.මිලියන 80.87 ක් වූ අත්‍යාවශ්‍ය අයිතමයන් 4ක් මිලදී ගැනීම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

**3.5.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, එම වාර්තාව 2017 ජූලි 04 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව භාණ්ඩ වර්ග 27 කට අයත් භාණ්ඩ 94 ක ඌණතාවයක් පැවතිණි. ඒ සම්බන්ධයෙන් 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.4 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

---

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් ලබා දී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| | | රු. | |
| මෝටර් වාහනයක් | පුද්ගලික සමාගමක් | 1,500,000 | 2016 මැයි 16 සිට 2017 අගෝස්තු 09 දින දක්වා |
| මෝටර් වාහනයක් | ඉහත සඳහන් පුද්ගලික සමාගමට | 2,500,000 | 2016 අගෝස්තු 26 සිට 2017 අගෝස්තු 09 දින දක්වා |

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු සමහර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| **වත්කම් වර්ගය** | **වත්කම් අයත්ව තිබුණු ආයතනය** | **වටිනාකම රු.** | **කාල පරිච්ඡේදය** |
|---|---|---|---|
| මෝටර් වාහනයක් | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 17,900,000 | 2015 ඔක්තොම්බර් 09 සිට 2017 අගෝස්තු 09 දින දක්වා |

## 3.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 103 (1) (ආ) | 2016 වර්ෂයේ සිදු වූ රිය අනතුරු 03 ක් සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කර නොතිබුණි. |
| (ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| (i) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශයේ වාහන 11 ක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| (ii) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛය | වාහන 11 ක අමාත්‍යාංශයේ නම සඳහන් කර නොතිබුණි. |

**3.8 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**(අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) **තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම**

1969 ස්ථාපිත කරන ලද වර්තමාන තෙල් පිරිපහදුව නවීකරණය හා පුළුල් කිරීම සම්බන්ධව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක කමිටු රැස්වීම් කිහිපයකදී විස්තරාත්මකව සාකච්ඡා කර තිබුණි. යෝජිත ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කිරීම පමණක් 2016 වර්ෂයේ දී සිදු වී තිබුණි.

(ii) **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය හා පුනරුත්ථාපනය**

භූගෝලීය පිහිටීම අනුව මුළු ලෝකයේම අවධානය යොමුවී ඇති ලෝකයේ දෙවන ගැඹුරුතම වරාය වන ත්‍රිකුණාමල වරාය තුල වර්ෂ 1930 ගණන් වල ස්ථාපිත කර ඇති තෙල් ටැංකි පද්ධතිය ඝණ මීටර් 12,500 ක ධාරිතාවකින් යුත් ටැංකි 102 කින් හා අනෙකුත් ආශ්‍රිත පහසුකම් වලින් සමන්විත වේ.

දැනට පවතින 99 ක් වූ මුළු ටැංකි ප්‍රමාණයෙන් පහළ කොටසේ ටැංකි 14 ක් ලංකා ඉන්දියානු තෙල් සමාගම භාවිතා කරනු ලබයි. අතහැර දමා තිබෙන ඉහළ කොටසේ ටැංකි 84 නවීකරණය සඳහා මූලික තීරණ ගැනීමේ කටයුතු 2011 සිට ආරම්භ කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානයේදී ද තීරණයකට එළඹ නොමැති බැවින් සංවර්ධනය හා පුනරුත්ථාපනය කිරීමට නොහැකි වී තිබුණි.

(iii) **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම**

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ සංරචක ලෙස අතිරේක ගබඩා පහසුකම් ඇති කිරීම සහ දැනට පවතින තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීමේ අංග ඇතුළත් වේ. ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තුව ඇමරිකන් ඩොලර් මිලියන 61 ක් වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තෙල් සැපයුම් නල පද්ධතිය නවීකරණය හා පුළුල් කිරීම සඳහා ඉංජිනේරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව ජාත්‍යන්තර ලංසු කැඳවන ලෙස 2015 දෙසැම්බර් 09 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යයන් 2016 වර්ෂය අවසන් වන විටත් සිදු වී නොතිබුණි.

(iv) **ඛනිජතෙල් නිෂ්පාදන සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීම**

2015 පෙබරවාරි 10 දින පැවති ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේදී ඛනිජතෙල් නිෂ්පාදන සඳහා මූල්‍යමය හා ආර්ථික වශයෙන් සාධාරණ මිල සූත්‍රයක් සකස් කිරීමට තීරණය කර තිබුණි. නමුත් අදාල කාර්යය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 12 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 51 | 32 | 19 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 23 | 04 |
| | **එකතුව** | **97** | **69** | **28** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 04 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 01 ක්ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 19 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක්ද වශයෙන් ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ පුරප්පාඩු 28 ක් පැවතුණි.